පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව සබරගමුව - සති පාසල

විෂය - ව්‍යාපාර හා ගිණුම්කරණ අධ්‍යයනය

සති පාසල 2021.06.28 සිට 2021.07.02 දක්වා

ශ්‍රේණිය - 10

සකස් කරන ලද්දේ-දෙහිඕවිට අධ්‍යාපන කලාපය

ඔබගේ විෂය අවබෝධය වැඩි දියුණු කර ගැනිම සඳහා ඔබගේ පෙළපොතේ පිටු අංක 70 සහ 71 හොඳින් අධ්‍යයනය කරන්න.

**6.පාඩම ගණුදෙනු වල ද්විත්ව බලපෑම**

6.1 ගණුදෙනු වල ද්විත්ව බලපෑම හැඳින්වීම.

ව්‍යාපාරයක දෛනිකව සිදු වන ගණුදෙනු වල ප්‍රතිඵල වශයෙන් ව්‍යාපාරයේ වත්කම්,වගකීම්,හිමිකම් , ආදායම්, සහ වියදම් වල අගය වෙනස් වේ.මෙම වෙනස් වීම් ගණුදෙනු වල ද්විත්ව බලපෑම ලෙස ගිණුම්කරණයේදී හැඳින්වේ.
උදා:- යන්ත්‍ර මිල දී ගැනීම - යන්ත්‍ර වැඩිවේ , මුදල් අඩුවේ
බැංකු ණය ගැනීම - මුදල් වැඩිවේ,බැංකු ණය වැඩිවේ

ඔබගේ පෙළපොතේ පිටු අංක 75 හි සඳහන් ක්‍රියාකාරකම 01 සඳහා පිළිතුරු ලියන්න.

6. 2 ද්විත්ව සටහන් ක්‍රමය
ගණුදෙනුවක ද්විත්ව බලපෑම පෙන්නුම් කිරීම සඳහා ගනුදෙනුවක වටිනාකම හර සහ බැර ලෙස ගිණුම් දෙකක සටහන් කිරීමේ ක්‍රමය ද්විත්ව සටහන් ක්‍රමය නම් වේ.

6.3 ගිණුම
කාලච්ඡේදයක් තුල වත්කමක, වගකිමක, හිමිකමක, ආදායමක හෝ වියදමක සිදුවන අඩුවීම හෝ වැඩි වීම වාර්තා කරනු ලබන පොදුවේ පිළිගත් ආකෘතිය ගිණුම නම් වේ.
ගිණුමක මූලිකාංග
1.ගිණුමේ නම
2.ගිණුමේ හර පැත්ත
3.ගිණුමේ බැර පැත්ත

. ..................... .ගිණුම

| දිනය | විස්තරය | ස. පි | වටිනාකම රු. | දිනය | විස්තරය | ස. පි | වටිනාකම රු. |
|---|---|---|---|---|---|---|---|
| (1) | (2) | (3) | (4) | (5) | (6) | (7) | (8) |

ඉහත ගිණුම් ආකෘතියේ දැක්වෙන අංක වලින් පහත කරුණු දැක්වේ.

(1) සහ (5) - ගනුදෙනුව සිදු වූ දිනය
(2) සහ (6) - ද්විත්ව සටහනේ අනෙක් සටහන තබා ඇති ගිණුමේ නම
(3) සහ (7) - ගනුදෙනුවේ අනෙක් සටහන තබා ඇති ගිණුම අඩංගු වන ලෙජරයේ පිටු අංකය
(4 ) සහ (8)-ගනුදෙනුවේ වටිනාකම